## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ (සිවිල්) III ශ්‍රේණිය/ පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව) / පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව) සඳහා වන (සීමිත) බඳවා ගැනීම – 2026

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ, තාක්‍ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී III ශ්‍රේණිය (සිවිල්) / පුහුණු ශ්‍රේණිය (සිවිල්) (එක් වසරක පුහුණු කාලය) / පුහුණු ශ්‍රේණිය (සිවිල්) (දෙවසරක පුහුණු කාලය) යන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සීමිත පදනම මත මධ්‍යම පළාත් රාජ්‍ය සේවයෙහි, සේවයේ නියුතු සුදුසුකම් ලත් නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය **2026.10.14** වේ.

**1. පොදු සුදුසුකම්:**

1.1. පත්වීම ස්ථිර කර තිබිය යුතුය.
1.2. නියමිත දිනට පූර්වාසන්නව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසෙයින් වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.
1.3. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධාන වලට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
1.4. සෑම අයැදුම්කරුවෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
1.5. සේවයට බඳවා ගැනීමට අවශ්‍ය සියලු සුදුසුකම් හා කොන්දේසි, **2026.10.14** දිනට සෑම අතින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**2. අධ්‍යාපන සුදුසුකම් , වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද**

සියලු අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය (තාක්‍ෂණ) සුදුසුකම් **2026.10.14** දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් | පළපුරුද්ද |
|---|---|---|---|
| | අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම් | | |
| 2.1. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ, තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය (සෘජු බඳවා ගැනීම) | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත් වීම. | I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (N.D.T.)<br>හෝ<br>II. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව<br>හෝ<br>III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව<br>හෝ<br>IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව<br>හෝ | ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර **05**ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |

| | | | |
|---|---|---|---|
| | | V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම<br><br>හෝ<br><br>VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම<br>හෝ<br><br>VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.<br><br>* බඳවා ගැනීමේ පරිපාටියේ දක්වා ඇති ඉහත සුදුසුකම්වලට විකල්ප වශයෙන් රා.ප.ච 46/90 හි දක්වා ඇති සුදුසුකම් අදාළ වේ. | |
| 2.2. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ, තාක්ෂණ නිලධාරී (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා) | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත් වීම. | I. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ( NCT ) ලබා තිබීම.<br>(උදා;- ජාතික තාක්ෂණ සහතිකය - සිවිල් )<br>හෝ<br><br>II. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ( NCIT ) ලබා තිබීම<br><br>හෝ<br><br>III. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් | ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර දෙපාර්තමේන්තු ගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |

| | | | |
|---|---|---|---|
| | | විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.<br>හා<br>අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්ද තිබීම. | |
| 2.3.මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා) | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත් වීම. | අදාළ නොවේ. | ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |

## 3. වැටුප් පරිමාණය:

3.1. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) III ශ්‍රේණිය

- 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි MN 3- 2025 අනුව, මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) III ශ්‍රේණියට හිමි වැටුප් පරිමාණය,
  රු. 52,250 – 10×800 - 11×,1190 -10×,1320 - 10×1,350 - රු.10,0040/- වේ
- මෙම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ.
- පත්වීම ක්‍රියාත්මක වන දින සිට මෙම චක්‍රලේඛයේ උපලේඛණ III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

3.2. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය
2026.04.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 (I) හි ඇමුණුම 02 (උපලේඛණ VI ) අනුව

| වසර | මාසික දීමනාව | |
|---|---|---|
| | 2026.01.01 දින සිට (රු.) | 2027.01.01 දින සිට (රු.) |
| 1 වසර | 43,274.00 | 45,230.00 |
| 2 වසර | 43,730.00 | 45,770.00 |

## 4. බඳවා ගැනීමේ කොන්දේසි :

4.1. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලටද මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2016.04.04 දින අනුමත කරන ලද 2013.06.01 දින සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලටද එම ව්‍යවස්ථාවේ දැනටමත් කර ඇති හෝ මින් මතුවටත් කෙරෙන සංශෝධන වලටද යටත්ව මෙම බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

4.2. පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 30%ක ප්‍රතිශතයක් සීමිත ධාරාවෙන් සම්පූර්ණ කර ගනු ලැබේ.

4.3. ලකුණු ප්‍රමුඛතාව අනුව පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබා ගත් සුදුසුකම් ලත් අපේක්ෂකයන් සිටී නම් හා එම පුරප්පාඩු ද පිරවීමේ සේවා අවශ්‍යතාවයක් තත් කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් අතුරින් වැඩිදුර තෝරා ගැනීමක් සිදු කිරීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2024 හි සඳහන් පරිදි අදාළ තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

4.4. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රම පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය.

4.5. අදාළ පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අදාළ ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධානවලට යටත්වේ.

4.6. පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියෙකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

4.7. මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 05 ක අවම වශයෙන් සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර එම කාලය තුළදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට හෝ වෙනත් තනතුරකට මුදාහැරීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

## 5. බඳවා ගැනීමේ ක්‍රමය

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු ප්‍රමුඛතාවය මත සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සුදුස්සන් තෝරා ගැනේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොවන අතර ලිඛිත විභාගයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40%ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා නොගන්නා අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සලකා බලනු නොලැබේ. විභාගයේදී දක්වන කුසලතාවය පදනම් කර ගෙන පුරප්පාඩු අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

5.1. **තාක්ෂණ සේවයේ (සිවිල්) III ශ්‍රේණිය, තාක්ෂණ සේවයේ (සිවිල්) (එක් වසරක පුහුණු කාලය) සහ තාක්ෂණ සේවයේ පුහුණු ශ්‍රේණිය (සිවිල්) (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීමේ ලිඛිත විභාගය.**

| විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40% |

5.2. **විභාගය සඳහා වන විෂය නිර්දේශය**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. සියළුම අයැදුම්කරුවන් මේ සඳහා පෙනී සිටිය යුතුය. |
| තාක්ෂණික හැකියාව | තනතුරට අදාළව තාක්ෂණික දැනුම මැන බැලෙන බහුවරණ හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.<br><br>මෙහිදී සිවිල් නිලධාරියෙකුට තිබිය යුතු දැනුම පරීක්ෂා කිරීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කටයුතු, මාර්ග තැනීම හා නඩත්තුව, ජල සම්පාදන හා ජල ප්‍රවාහය සම්බන්ධ ප්‍රශ්න වලින් සමන්විත වේ. |

5.3. මීට අදාළ ලිඛිත විභාගය මහනුවර නගරයේදී පවත්වනු ලැබේ.

5.4. මෙම විභාගය කල්දැමීම හෝ අවලංගු කිරීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

## 6. අයැදුම් කිරීමේ ක්‍රමය :

6.1. අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිත කරමින් A4 ප්‍රමාණයේ කඩදාසි වල පිළියෙල කර අපේක්ෂකයා තම අත්අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 03 තෙක් පළමු පිටුවටද අංක 04 සිට 10 තෙක් දෙවන පිටුවටද, ඉතිරිය තුන්වන පිටුවටද, වන සේ සකස් කළ යුතුය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අයැදුම්පත්‍ර , අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර සහ නිවේදනයේ සඳහන් පරිදි මූලික සුදුසුකම් නොමැති බව අයදුම්පත්‍රයේ තොරතුරු අනුව පෙනී යන්නේ නම් ද කිසිදු දැනුම්දීමකින් තොරව එම අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

6.2. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍ර වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද , දෙමළ අයදුම්පත්‍ර වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතුය.

6.3. සෑම අපේක්ෂකයෙකුම විභාග ගාස්තුවක් මධ්‍යම පළාත් සභාවට ගෙවිය යුතුය. විභාග ගාස්තුව රු.600/-කි. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන පරිදි අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා ලබාගත් නිල් පැහැති ලදුපතක් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. එකී ලදුපත නොමැතිව යොමු කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර විභාගය සඳහා ගෙවන ලද විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත හෝ ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ.

6.4. අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට **2026.10.14** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **'ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර '** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයැදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **" මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ (සිවිල්) III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම (සීමිත) – 2026 / (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණියට (එක් වසරක) නිලධාරීන් බඳවා ගැනීම (සීමිත) - 2026 / (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණියට (දෙවසරක) නිලධාරීන් බඳවා ගැනීම (සීමිත) – 2026"** යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ. අයදුම්කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසු ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

6.5. අයදුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලිපියක් හෝ තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

6.6. අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

6.7. මෙම නිවේදනයේ සඳහන් සියලු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

6.8. අපේක්ෂකයෙකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විසින් මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

6.9. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.cp.gov.lk** හි පළ කරනු ලැබේ. ප්‍රවේශ පත්‍ර විභාගය පැවැත්වීමට දින 14 කට පෙර අයදුම්කරුවන්ගේ අයදුම්පතෙහි සඳහන් ජංගම දුරකතන අංකය වෙත කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ අයදුම්කරු විසින් අයදුම්පතෙහි දක්වා ඇති විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපෑල මඟින් හෝ යොමු කරනු ලැබේ.

6.10. උක්ත නිවේදනය පළ වී දින 04ක් හෝ 05ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් ඒ බව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී ඔබගේ අයැදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්ද, අයැදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ විභාග අංශය වෙතින් විමසීම් කළ යුතුය.

6.11. අත්සන සහතික කිරීම

අයදුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන් සහතික කිරීම, අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් අයෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය

## 7. විභාගයට ඇතුළත් කර ගැනීම

7.1. අදාළ විභාග ගාස්තු ගෙවා, නිසි ලෙස අයදුම්පත්‍ර සම්පූර්ණ කර , නියමිත දිනට පෙර එවා ඇති සියලුම අයදුම්කරුවන් වෙත මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර පළමුවෙන්ම විභාගයට පෙනී සිටින දින විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

7.2. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

## 8. අපේක්ෂකයාගේ අනන්‍යතාවය

තමා පෙනී සිටින විභාගය සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය.මේ සඳහා පහත ලේඛන පමණක් පිළිගනු ඇත.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

## 9. විභාග මාධ්‍යය

9.1. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ.
9.2. අපේක්ෂකයෙකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතුය.
9.3. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

## 10. සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම

10.1. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුවද ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

10.2. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලෙකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු / ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහු /ඇය වෙත තවදුරටත්

පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහකිරීමට වුවද යටත් වේ.

**11.** මෙම විභාගයේ ප්‍රතිඵල ලේඛණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.cp.gov.lk** මඟින් පළ කරනු ඇත.

**12.** මෙම නිවේදනයේ ආවරණය වන / නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද මෙම විභාගය පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**13.** මෙම බඳවා ගැනීමට අදාළ අයදුම්පත්‍රය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.cp.gov.lk** හි පළකර ඇති අතර එහිදී භාගත කරගැනීමට හැකි බවද කාරුණිකව දන්වමි.

**14.** මෙම නිවේදනයේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වෙනු ඇත.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

2026 සැප්තැම්බර් මස 28 වැනි දින
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.